(c) www.sinhalalyrics.com

කප් සුවහස් කල් පෙරුම් පුරාගෙන
අනන්ත බාදක දුක් පීඩා විඳ
භවෙන් භවය යන මං සළකුණු දැක
ඔබව සොයා ආවා

සත්සමුදුර තරණය කර ආවා
සත්කුළු පව් අතරින් දිව ආවා
තරු එළියෙන් පියවර මැන ආවා
ඔබව සොයා ආවා

නොනිමෙන ගමනක ආශා පොදි බැඳ
මිරිගුව පසුපස දිව යන ඉකිබිඳ
දිවි වෙණ වැයුමට ඔබ පසෙකින් හිඳ
ඔබව සොයා ආවා

පද රචනය - සුනිල් ආරියරත්න
සංගීතය -